# 2023/10/12 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/10/12 වන දින පෙ.ව.09.00ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරි ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරි ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා, කාර්මික නිලධාරි ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය, සංවර්ධන නිලධාරි ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරී කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා හා විෂය නිලධාරී පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව සභා ලේකම්තුමිය විසින් 2023/09/27 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව කමිටු සාමාජිකයින් ඒකමතිකව අනුමත කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛණය සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල වවුචර්පත්

a. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛන

| අනු අංකය | නම හා විස්තරය | ගෙවූ මුදල | කමිටු තීරණය |
|---|---|---|---|
| 01. | ඩී.එම්.ආර්.යූ.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා 2023 සැප්තැම්බර් මස 16 සිට 31 දක්වා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. | 103,022.00 | නිර්දේශ කරන ලදී. |
| 02. | පී.වාසනා නිල්මිණී මිය, සංවර්ධන නිලධාරී - රාජ්‍ය ආයතනවල භාෂා සැලැසුම් පිළියෙල කිරීමේ පුහුණු වැඩසටහන සඳහා ඌව පළාත් සභා පරසි සමරවීර ශ්‍රවණාගාරයට යාම වෙනුවෙන් 2023/09/12 දින ගමන් වියදම් ගෙවීම. | 980.00 | නිර්දේශ කරන ලදී. |
| 03. | ටී.එම්.ඩී.එම්.කුමාරිහාමි මිය, සංවර්ධන නිලධාරී - ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා වන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා දීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා හෙරිටේජ් හෝටලය සඳහා 2023/10/05වන දින සඳහා ගමන් වියදම් ගෙවීම. | 1,000.00 | නිර්දේශ කරන ලදී. |
| 04. | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2023/03/19 දිනෙන් පසු සභා ලේකම් වෙත පැවරී ඇති බලතල, කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් 2023 සැප්තැම්බර් මස මාසික දීමනා ගෙවීම. | 20,000.00 | නිර්දේශ කරන ලදී. |
| 05. | රාජක්‍රිෂ්ණන් තනලෙච්චමී මිය, රෝබේරිය වතු යාය, පිටමාරුව - 2023 පෙබරවාරි මස මහා සභා වාර්තාව දමිළ භාෂාවට පරිවර්තනය කිරීම වෙනුවෙන් ගෙවීම. | 5,000.00 | නිර්දේශ කරන ලදී. |
| 06. | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය හා ඩෙංගු සම්බන්ධ රාජකාරි කටයුතු සිදු කිරීම වෙනුවෙන් 2023 අගෝස්තු මස සඳහා ගෙවීම් කිරීම. | 2,900.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 07. | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල 2023/07/27 දින සිට 2023/09/27 දින දක්වා පැවති කළමනාකරණ කමිටු දීමනා ගෙවීම. | 35,000.00 | නිර්දේශ කරන ලදී. |
| 08. | ඉන්ද්‍රා මෝටර් ස්පාරස් ප්‍රයිවට් ලිමිටඩ්, අංක 30/13, ගංභාසිරි පාර, ගම්පහ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු UPLL 7774 කැබ් රථයට ඉදිරි පස බ්‍රේක් ඩ්‍රම් එක යෙදීම වෙනුවෙන් ගෙවීම.(බිල්පත් අංකය-NGP2308/0001) | 57,852.12 | නිර්දේශ කරන ලදී. |
| 09. | කළමනාකරු, තව්දු පොත්හල, මීගහකිවුල - මීගහකිවුල, කළුගහකඳුර, පිටමාරුව පුස්තකාල වල ජුලි හා අගෝස්තු පුවත්පත් බිල්පත් පියවීම. | 30,500.00 | නිර්දේශ කරන ලදී. |
| 10. | ඩී.එම්.අයි.එස්.දිසානායක මයා, අයි.එස්.මාර්කටින්, නුවර පාර, මීගහකිවුල - කෝමාරික ජල යෝජනා ක්‍රමය සඳහා බට සහ ෂෙකෙට් ලබා ගැනීමම සඳහා බිල්පත් පියවීම. (බිල්පත් අංකය-3051) | 12,150.00 | නිර්දේශ කරන ලදී. |
| 11. | කළමනාකරු,රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයේ අවශ්‍ය ද්‍රව්‍ය ගැනීම වෙනුවෙන් මිල ගණන් පියවීම.(බිල්පත් අංකය-1740) | 1,000.00 | නිර්දේශ කරන ලදී. |
| 12. | ඒ.එම්.විජිත ප්‍රියන්ත මයා, රියදුරු - ඒ.එම්.විජිත ප්‍රියන්ත මයාගේ රියදුරු බලපත්‍රය අලුත් කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 4,175.00 | නිර්දේශ කරන ලදී. |

b. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම සඳහා සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

c. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කාරය මණ්ඩල නිලධාරීන් සඳහා 2023 ඔක්තෝම්බර් මස වැටුප් ගෙවීම සඳහා සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

II. මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන කිඩ්ස් පෙර පාසල සඳහා 2024 වර්ෂය සඳහා ළමුන් බඳවා ගැනීමේ කොන්දේසි සම්බන්ධව සාකච්ඡා කිරීමේදී පහත 2023 වර්ෂයේ බඳවා ගැනීමට අදාළ කර ගත් කොන්දේසි වලට අමතරව පහත සඳහන් කොන්දේසි ඇතුලත් කිරීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලද අතර 2023 වර්ෂයේ වර්ෂ අවසාන උත්සවය සිදු කිරීම සඳහා සහා අරමුදලින් යම් කිසි මුදලක් වැය වෙනවා නම් එම වැය වන මුදල සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරන ලෙස කළමනාකරණ කමිටුව විසින් තීරණය කරන ලදී.

- රාජ්‍ය සේවයේ නියුතු දෙමාපියන්ගේ දරුවන් 2024 වර්ෂය ඇතුළත් කරගැනීමක් සිදු නොකරනු ලබන අතර, යම් හෙයකින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ නියුතු සේවක මහත්ම මහත්මීන්ගේ දරුවන් 05 දෙනෙකු අයදුම් කර නොමැති වුවහොත් එම අවස්ථාව මීගහකිවුල නගර සීමාව තුළ පවත්නා රාජ්‍ය ආයතන වල සේවයේ නිරත නිලධාරීන් සඳහා ලබාදීම.
- වසර දෙකක් සඳහා දරුවන් බඳවා ගන්නා ලබන අතර, එම වසර දෙක තුළ දරුවාගේ අඛණ්ඩ පැමිණීම අත්‍යවශ්‍ය වේ. යම් හෙයකින් අඛණ්ඩව මාස තුනක කාලයක් ඉගෙනුම් කටයුතු සඳහා දරුවා නොපැමිණියහොත් එම දරුවා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙන් ඉවත් කිරීමට කටයුතු කරන අතර, නැවත අවස්ථාවක් ලබාදීම සිදු නොකරනු ලැබේ.
- එලෙස නොපැමිණෙන දරුවකු ඉවත් කිරීමක් සිදු කිරීමක් සිදු කළහොත් එම පුරප්පාඩුව පිරවීම වර්ෂයේ මුල් මාස 06 තුළ පමණක් සිදු කරනු ලැබේ. දරුවකු ඉවත් කිරීමක්

වර්ෂයේ අවසන් කාර්තුව සිදු කළහොත් එම පුරප්පාඩුව පිරවීමක් සිදු නොකරනු ලැබේ. දරුවෙකු ඇතුළත් කිරීම සම්බන්ධයෙන් අවසාන මාස 06 තුළ සිදු කරන කිසිදු ඉල්ලීමක් සලකා නොලැබේ.

III. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත යන්ත්‍ර සහයක ලෙස සේවයේ නියුතු ආර්.එම්.චම්පික දිල්හාන් රත්නායක මයා සඳහා දැනට මසකට දින 15ක් සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලැබී ඇත. ඔහු විසින් සේවය කරන දින 15 සේවා කාලය දින 21ක් දක්වා දීර්ඝ කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඔහුගේ සේවා කාලය දීර්ඝ කිරීමට අදාළව සේවයට පැමිණීමේ හා හැසිරීමේ වාර්තාවක් කාර්මික නිලධාරී වෙතින් කැඳවන ලද අතර එම සහතික කරන ලද වාර්තාවට අනුව දින 15 දක්වා දීර්ඝ කරත් සේවයට පැමිණීමේ වාර්තාව සතුටුදායක නොවන හෙයින් මේ සඳහා කමිටු නිර්දේශය ලබා දිය නොහැකි බව කළමනාකරණ කමිටුව විසින් තීරණය කරන ලදී.

IV. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කලර් ප්‍රින්ටරය අළුත්වැඩියා කිරීමට අවශ්‍ය මිළ ගණන් කැඳවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

V. ප්‍රාදේශීය සංවර්ධන ආධාර වැඩසටහන (LDSP) යටතේ 2023/2024 BT/04 හා PT03 යටතේ ඉදිරි අදියරයන් සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයේ ගම් මට්ටමින් හඳුනා ගත් ව්‍යාපෘතිවලින් පරීක්ෂා කරන ලද ප්‍රමුඛතා ලැස්තුවට ඇතුලත් ඇමුණුමේ සඳහන් උප ව්‍යාපෘති යෝජනා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**<u>පළාත් පාලන ආයතනවල LAPDP වෙතින් BT 4 සඳහා පරීක්ෂා කරන ලද ප්‍රමුඛතා ලැයිස්තුව</u>**

| නව ප්‍රමුඛතා අනු පිළිවෙළ | පාර්ශවකරුවන් සමග සිදුකරන ලද සාකච්ඡාවන්හි දිගු ලැයිස්තුවට අනුව පැරණි ප්‍රමුඛතා අනුපිළිවෙල | උප ව්‍යාපෘතියේ නාමය |
|---|---|---|
| 1 | 1 | මීගහකිවුල බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදි කිරීම |
| 2 | 53 | කෝමාරික කණුගොල්ල ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම. |
| 3 | 24 | කරඳගහමඩ පාසල අසල සිට දොඩම්අතුලුපත කඳුර දක්වා කොන්ක්‍රීට් කිරීම. |
| 4 | 5 | කණුගොල්ල සිට වැල්ලේවෙල දක්වා මාර්ගය කිලෝමීටර් 02ක් පස්පුරවා, ග්‍රේවල් අතුරා පාලම හා බෝක්කු සහිතව කොන්ක්‍රීට්කිරීම |
| 5 | 13 | අකුරුකඩුව පානිය ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම |

**<u>PT 3 සඳහා පරීක්ෂා කරන ලද ප්‍රමුඛතා ලැයිස්තුව</u>**

| නව ප්‍රමුඛතා අනුපිළිවෙළ | පාර්ශවකරුවන් සමග සිදුකරන ලද සාකච්ඡාවන්හි දිගු ලැයිස්තුවට අනුව පැරණි ප්‍රමුඛතා අනුපිළිවෙල | උප ව්‍යාපෘතියේ නාමය |
|---|---|---|
| 1 | 1 | ඊ පුස්තකාලයක් ආරම්භ කිරීම. |
| 2 | 13 | සතිපොල භූමියේ පොදු ආර්ථික මධ්‍යස්ථානයක් ඇති කර මිලදී ගැනීම ප්‍රා.ස මගින් සිදු කිරීම. |
| 3 | 15 | දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම |
| 4 | 5 | ප්‍රදේශයේ පවතින ආහාර ද්‍රව්‍ය (කොස්) විජලනය කර විදේශීය වෙළඳපොලට අලෙවි කිරීම මගින් විදේශ විනිමය ඉපයීම. |
| 5 | 6 | යන්ත්‍ර සූත්‍ර හා පුහුණුව ලබා දී බතික් කර්මාන්ත ශාලාවක් ඉදි කිරීම. |

VI. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 අගෝස්තු මස මාසික ආදායම් විශ්ලේශණ වාරතාව සලකා බලන ලදී.

VII. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 අගෝස්තු මස මාසික ගෙවීම් විශ්ලේශණ වාරතාව සලකා බලන ලදී.

VIII. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 අගෝස්තු මස සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සලකා බලන ලදී.

මීළඟට න්‍යාය පත්‍රාණුකූලව වෙනත් කරුණු ඉදිරිපත් කරන ලදී.

1) ප්‍රාදේශීය සංවර්ධන ආධාර වැඩසටහන (LDSP) යටතේ 2023/2024 BT/04 යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත මීගහකිවුල බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමට අපේක්ෂිත ස්ථානයේ පවතින මීගහකිවුල ප්‍රාදේශීය සභා පැරණි කාර්යාල ගොඩනැගිල්ල සහ ඒ අසල තිබෙන ජල ටැංකිය කඩා ඉවත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ BT 04 සහ PT 03 වැඩසටහන යටතේ ක්‍රියාත්මක කල යුතු උප ව්‍යාපෘති තෝරා ගැනීමට අදාළව 2023.10.13 දින සහ 2023.10.20 දින පැවැත්වීමට සැලසුම් කර ඇති රැස්වීම් 02 පැවැත්වීමට සහ එම රැස්වීම් පැවැත්වීමට වැය වන රු:75,000.00ක මුදලට අදාල දළ ඇස්තමේන්තුව සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3) මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පොදු පහසුතා මධ්‍යස්ථානය සඳහා ගලි රථ සේවාව ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මහියංගණය වෙත රු:23,800.00ක මුදලක් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4) රජයේ කත්සේරු දෙපාර්තමේන්තු අංක BD/RP/2256 හා 2023.08.09 දිනැති ලිපිය මඟින් මීගහකිවුල නව බස් නැවතුම්පොලේ ඉහළ මහලේ සහ පහළ මහලේ කඩ කාමරවල සහ අංක BD/RP/2444 හා 2023.08.09 දිනැති ලිපිය මඟින් කරමැටිය කඩ කාමරවල ඉදිරිපත් කර ඇති තක්සේරු වාර්තාවේ වටිනාකම් පදනම් කර ගනිමින් 2024 වර්ෂයට අදාළ අය කර ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තූති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.10.30ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) -
2) ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
3) ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා (කමිටු සාමාජික) -
4) ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා (කමිටු සාමාජික) -
5) පී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) -
6) ඒ.පී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) -
7) කේ.තරිඳු දර්ශන ප්‍රියකෑළුම් මහතා (කමිටු සාමාජික) -